## තිහගොඩ ප්‍රාදේශීය සභාව.

## මාතර දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011අගෝස්තු 03 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 සැප්තැම්බර් 15 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති තිහගොඩ ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ,

(අ) ජර්නල් සටහන් 20 යටතේ 2010 වර්ෂයේ කුලී ආදායම වශයෙන් අයකල යුතු රු.690,444 ක් හිඟ කුලී ආදායම් ගිණුමට හර කලද ලෙජරයට අනුව රු.782,683 ක් ලෙස හර කර තිබුණෙන් වෙනස රු. 92,239 ක් විය.

(ආ) ජර්නල් සටහන් 17 යටතේ ඉකුත් වර්ෂයට අදාලව ලැබුණු මැතිවරණ අත්තිකාරම් රු.32,820 ක මුදල සමුච්චිත අරමුදලට හර කරනු වෙනුවට අවිනිශ්චිත ගණුමට හර කර තිබුණි.

(ඇ) ජර්නල් සටහන් 10 යටතේ ඉකුත් වර්ෂයේ IV කාර්තුව වෙනුවෙන් ගෙවන ලද වාරිකය වූ රු.55,420 ක මුදල දේශය ණය හා සංවර්ධන අරමුදල හර කොට සමුච්චිත අරමුදල බැර කරනු වෙනුවට ණයහිමි ගිණුම හර කොට දේශීය ණය හා සංවර්ධන අරමුදල් ගිණුම බැර කර තිබුණි.

(ඈ) ජර්නල් සටහන් 14 යටතේ සමාලෝචිත වර්ෂයට අදාලව මිලදී ගත් ප්‍රාග්ධන වත්කම් සඳහා ප්‍රාග්ධන වැය ගිණුම රු.16,930 කින් හර කලද ණයහිමි ලෙජර් ගිණුම් වල එවැනි සටහනක් නොතිබුණෙන් ණයහිමි ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ජර්නල් සටහන් 09 යටතේ 2010 වර්ෂයට අදාල ණයහිමි ප්‍රතිපාදන ඇති කිරීමේදී විවිධ ණයහිමි (සැපයීම්) ගිණුම රු.402,316 කින් බැර කර තිබුණද ලෙජර් ගිණුමට අනුව රු.385,386 ක් බැර කර තිබුණෙන් වෙනස රු.16,930 ක් විය.

(ඊ) ජර්නල් සටහන් 16 යටතේ පසුගිය වර්ෂවල කර්මාන්ත සඳහා ගෙවිය යුතු රු.99,630 ක නිශ්චිත බදු, ආදායමට ගැනමේදී සමුච්චිත අරමුදල් ගිණුමට බැර කරනු වෙනුවට සදොස් ලෙස වෙනත් ආදායම් ගිණුමට බැර කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයුර්වේද ඖෂධ තොග වටිනාකම මූල්‍ය ප්‍රකාශන අනුව රු.68,835 ක් වූ අතර ආයුර්වේද තොග ලේඛණයට අනුව රු.84,675 ක් වූයෙන් වෙනස රු.15,840 ක් විය.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.1,393,475 ක් ගිණුම් වලින් අත්හැර තිබුණි.

1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 07 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගෙන් එකතුව රු.46,376,410 ක්වූ අතර උපයෝගී ලේඛන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.37,001,249 ක් වූයෙන් වෙනස රු.9,375,161 ක් විය.

1.3.3 <u>පැහැදිලි නොකල වෙනස්කම්</u>

2010 දෙසැම්බර් 31 දින මාසික ලැබීම් සාරාංශ (ප්‍රා.ස.16) හා ලෙජර් ගිණුම් අතර රු.5,821 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 <u>අවිනිශ්චිත ගිණුම</u>

ලෙජරයට අනුව සමාලෝචිත වර්ෂයේ අවසානයට අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය රු.775,092 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව බැර ශේෂය රු.2,331,789 ක් වූයෙන් වෙනස රු.1,556,697 ක් විය.

1.3.5 <u>ගෙවිය යුතු ගිණුම්</u>

(අ) 2010 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.35,759,006 ක් විය.

(ආ) 2005 වර්ෂයේ සිට මේ දක්වා පැවත එන රු.8,984,628 ක කර්මාන්ත ණයහිමි ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.6 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

ගිණුම් විෂයයන් 08 කට අයත් රු.54,943,815 ක් වටිනා ශේෂයන් සඳහා සමීක්ෂණ මණ්ඩල වාර්තා, ස්ථාවර වත්කම් ලේඛණය, අයිතිය හා පැවැත්ම තහවුරු කෙරෙන ලිපිලේඛණ, තොග ලේඛණ, ශේෂ තහවුරු කිරීමේ ලිපි, කාල විශ්ලේෂණ, ණයගැති/ණයහිමි ලේඛණ ආදිය නොමැතිකමින් එකී විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 1.3.7 අනුකූල නොවීම්

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | | | අනුකූල නොවීම් |
|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| | (i) | රීති 143 | එක් එක් තැන්පතු වර්ගය වෙනුවෙන් වෙන් කර ඇති මුදල් පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් එක් එක් වර්ෂය අවසානයේ පිළියෙල කර නොතිබුණි. |
| | (ii) | රීති 164 | සභාවේ ගිණුම් ලියවිලි ලේකම් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් දිනපතා පරීක්ෂා කර ඒ බවට කෙටි අත්සන් තැබීම මගින් තහවුරු කර නොතිබුණි. |
| | (iii) | රීති 180 | මුදල් හා ගබඩා භාරව ක්‍රියා කරන නිලධාරීන්, ආදායම් එකතු කරන නිලධාරීන් හයදෙනෙකු ඇපකර ඉදිරිපත් කර නොතිබුණි. |
| | (iv) | රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි සත්‍ය වැය සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| | (v) | රීති 206 | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| | (i) | මු.රෙ. 262 (2) | ගෙවීම් වවුචර්වල හා අදාල බිල්පත්වල ගෙවීම් මුද්‍රාව තබා නොතිබුණි. |
| | (ii) | මු.රෙ.396 (ඈ) | නිකුත් කළ නමුත් මාස 06 කට වැඩි කාලයක් ඉකුත් වූ වටිනාකම රු.19,314 ක් වූ චෙක්පත් 13 ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02/ දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | | පරිගණක 08 ක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික විධිමත් පරිදි සකස් නොකළ ණය ඉල්ලුම්පත්‍ර සඳහා විධිවිධානයන්ට සමාජවාදී ජනරජයේ පටහැනිව ණයලාභීන් 12 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී ආයතන සංග්‍රහය xxiv රු.482,420 ක් ගෙවා තිබුණි.
පරිච්ඡේදයේ 4.2.3 වගන්තිය

1.3.8 ලේඛන පවත්වාගෙන යාමේ අඩුපාඩු

පහත සඳහන් ලේඛන යාවත්කාලීන හා විධිමත්ව පවත්වා නොතිබුණි.

(i) ස්ථාවර වත්කම් ලේඛනය
(ii) සේවක ණය ලේඛනය
(iii) තැන්පත් ලේඛනය
(iv) ණයගැති ලේඛනය
(v) ණයහිමි ලේඛනය

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,585,636 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 149,861 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් ඇතුළු හිඟ ආදායම් පිළිබඳ තොරතුරු 2011 මාර්තු 03 දිනැති මාගේ ලිපියට අනුව නියමිත ආකෘතියක ඉදිරිපත් කරන ලෙස සභාපතිවරයාගෙන් ඉල්ලා තිබූ නමුත් විගණනයට ඉදිරිපත් කර තිබූ තොරතුරු නිරවද්‍ය නොවන බැව් විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේ වුවද, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබ හිඟ ආදායම් ප්‍රකාශය අනුව, 2010 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය ඉකුත් වර්ෂය සමඟ සසඳා සාරාංශ කර පහත දක්වා ඇත.

| ආදායම් විෂයය | හිඟ ආදායම දෙසැම්බර් 31 දිනට | | වැඩිවීම % |
|---|---|---|---|
| | 2010 | 2009 | |
| | රු.'000 | රු.'000 | |
| අක්කරබදු | 19 | 17 | 11.7 |
| වෙළඳ බලපත්‍ර | 33 | 15 | 120.0 |
| බදුකුලී | 236 | 143 | 65.0 |

| | | | |
|---|---|---|---|
| ජලබදු | 265 | 213 | 24.4 |

2.2.2 <u>හිඟ බදු හා ගාස්තු</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂවලට අදාල අයවිය යුතු රු.287,968 ක බදු හා ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 සහ 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 <u>පොදු වෙළඳ පොළ කඩ කාමර බදු.</u>

තිහගොඩ පොදු වෙළඳ පොල කඩ කාමර හා යටියන පොදු වෙළෙඳ පොල කඩ කාමර බදුදීම සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු මෙසේය.

(i) තිහගොඩ පොදු වෙළඳ පොල කඩ කාමර 13 ක්ද, යටියන පොදු වෙළඳ පොල කඩ කාමර 09 ක්ද, ගිවිසුම් කාලය අවසන්ව ඇතත් බදු ගිවිසුමේ අංක 01 කොන්දේසිය ප්‍රකාර නැවත එම ගිවිසුම් බලාත්මක කර නොතිබුණි.

(ii) බදු ගිවිසුමේ අංක 04 කොන්දේසිය පරිදි තිහගොඩ පොදු වෙළඳ පොල කඩකාමර 04 කින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.76,983 ක කුලී හිඟ හිට තිබූ අතර ගිවිසුම් කොන්දේසි අංක 09 පරිදි හිඟ කුලී අයකර ගැනීමට නීතිමය පියවර ගෙන නොතිබුණි.

(iii) සභාව සතු කඩ කාමර සම්බන්ධයෙන් දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ සඳහන් ක්‍රියාපටිපාටි අංක 05, 06, 07 සහ 11 පරිදි කටයුතු කර නොතිබුණි.

2.2.4 <u>උසාවි දඩ මුදල්</u>

විවිධ ආඥා පනත් යටතේ මහෙස්ත්‍රාත් අධිකරණයකින් 2010 දෙසැම්බර් 31 දින දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු. 257,584 වූ දඩ මුදල් සභාවට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 <u>මුද්දර ගාස්තු</u>

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ගෙන් රු. 4,124,382 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමග පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| පුනරාවර්තන වියදම | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 10,048 | 8,862 | 1,186 | 9,663 | 8,611 | 1,052 |
| අනෙකුත් | 5,235 | 3,022 | 2,213 | 5,240 | 4,574 | 666 |
| උප එකතුව | 15,283 | 11,884 | 3,399 | 14,903 | 13,185 | 1,718 |
| ප්‍රාග්ධන වියදම | 68,590 | 66,170 | 2,420 | 85,100 | 37,839 | 47,261 |
| මුළු එකතුව | 83,873 | 78,054 | 5,819 | 100,003 | 51,024 | 48,979 |

2.4 මානව සම්පත් කළමනාකරණය

2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

(අ) 2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 02 | 02 |
| ද්විතියික | 05 | 12 |
| ප්‍රාථමික | 15 | 13 |
| වෙනත් (අනියම් , තාවකාලික) | - | 09 |
| | 22 | 36 |

(ආ) සමාලෝචිත වර්ෂයේ කාර්ය මණ්ඩල වැටුප් සඳහා වූ වියදම රු.8,262,203 ක් වුවද පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රතිපූර්ණය කර තිබුණේ ඉන් රු. 8,203,000 ක් පමණක් හෙයින් සභාවට රු.59,203 ක අතිරේක වැයබරක් ඇතිවී තිබුණි.

(ඇ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 ජනවාරි 03 හා 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14 හා අංක 28 මගින් පළාත් පාලන ආයතනවල අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් සේවකයින් බඳවා ගැනීම අත්හිටුවා ඇතත් එකී විධිවිධාන වලට පටහැනිව සේවකයින් 09

දෙනෙක් බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් වශයෙන් සහා අරමුදලින් රු. 931,522 ක් ගෙවා තිබුණි.

2.5 වත්කම් කළමනාකරණය

2.5.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.47,949,184 ක් විය.

2.5.2 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු. 655,420 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම්විල ශේෂ එකතුව රු.62,966 කි.

2.6 අභ්‍යන්තර විගණනය

සභාව තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

03. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය